පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சி திணைக்களம் (மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහ පාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | LGD/02/21/03/26 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2017.11. 13 |

බස්නාහිර පළාතේ සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත,

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙර පාසල් ගුරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය**

ගරු ආණ්ඩුකාරතුමාගේ අංක: GOS/ADM/4/7/257 හා 2017.10.25 දිනැතිව අනුමත කර ඇති බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙර පාසල් ගුරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියෙහි පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවන බව කාරුණිකව දන්වමි.

ජේ.එච්.සේනාරත්න,
ප්‍රධාන කළමනාකරණ සහකාර,
පළාත් පාලන කොමසාරිස්(බ.ප) වෙනුවට.

පිටපත: පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/කළුතර/ගම්පහ)

222
215

# බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙර පාසල් ගුරු තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.

1. **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව :- පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප)
යොමු අංකය :- එල්ජීඩී/02/21/03/26
දිනය :- 2017.08.08

1.2 අමාත්‍යාංශය :- පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
යොමු අංකය :- CM/WP/E15/5/1-2
දිනය :- 2017/08/11

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම
යොමු අංකය :- ඩීඑම්එස්/0027
දිනය :- 2014.11.26

1.4 ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය
යොමු අංකය :- CSO/PTR/15/3/6
දිනය :- 2017-08-22

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :-
දිනය :-

1.6 බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :- WPC/PSC/ADM/16/4/97
දිනය :- 2017.10.06

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය
යොමු අංකය :-
දිනය :-

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය : 2017.10.25
යොමු අංකය : GOS/ADM/4/7/252

ප්‍රධාන ලේකම් කාර්යාලය 01 NOV 2017 බස්නාහිර

**පත් කිරීම් බලධරයා** :- මහා නගර සභාවක නාගරික කොමසාරිස් වන අතර නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක ලේකම් වේ.

**ක්‍රියාත්මක වන දිනය** :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය :- කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2.

3.2 ශ්‍රේණි :- III, II, I ශ්‍රේණිවලින් සමන්විතයි.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :-

ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූ ද , ඒකළ ස්වරූපයේ වූ ද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම :-

ප්‍රජා සංවර්ධන කාර්යයේ දී තම බල ප්‍රදේශයේ පෙරපාසල් වියේ දරුවන්ගේ පූර්ව ළමාවිය සංවර්ධනය උදෙසා පළාත් පාලන ආයතනයක් විසින් ඉටු කළ යුතු කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමේ දී තමා වෙත භාර වී ඇති ළමුන්ගේ සහජ දක්ෂතා හඳුනා ගැනීම හා එම දක්ෂතා වැඩි දියුණු කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම හා වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම, අධ්‍යාපන කටයුතු සඳහා මූලික අඩිතාලම දැමීම යන කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. සේවා අවශ්‍යතාව මත පෙර පාසලේ උන්නතිය උදෙසා වරින් වර රාජකාරි ලැයිස්තු මගින් ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන රාජකාරි ඉටු කරනු ලැබිය යුතුය.

4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප්

5.1 වැටුප් කේත අංකය :- MN-1 2016 (රා.ප.ච. 3/2016 අනුව)

5.2 වැටුප් පරිමාණය :- රු.27140- 10X300-11 X 350-10X 495 - 10 X 660 - 4554...

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 27,140/- |
| II | පියවර 12 | 30,490/- |
| I | පියවර 23 | 34,485/- |

සටහන:

බඳවා ගැනීම්, උසස් කිරීම්වල දී නිකුත් කරනු ලබන පත්කිරීම් ලිපි වල වැටුප් පරිමාණය සඳහන් කිරීමේ දී ... 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි සඳහන් නියමිත වැටුප් පරිමාණය සඳහන් කළ ... එහෙත් ගෙවීම් සිදු කළ යුත්තේ උපලේඛන II හි සඳහන් පරිදි බැවි අදාළ පත්කිරීම් ලිපියේ සඳහන් කළ යුතුය.

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පෙරපාසල් ගුරු | III,II,I ශ්‍රේණි | 203 | පෙර පාසල තුළ තමා වෙත භාර වී ඇති ළමුන්ගේ අධ්‍යාපන කටයුතු හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය පිළිබඳ වගකීම දැරිය යුතු අතර, මීට අමතරව දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් තම රාජකාරි ලැයිස්තුව යටතේ පවරා ඇති සහ සේවා අවශ්‍යතාව මත වරින් වර පවරනු ලබන රාජකාරි කටයුතු ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- 203 යි.

(ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III,II,I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් ලෙස සැලකේ)

තනතුර අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව ඇමුණුම 01 හි දක්වා ඇත.

7. බඳවා ගැනීමේ ක්‍රමය :-

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

සටහන :- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවලදී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

221
216

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිත ව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :- පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත්(ලියාපදිංචි කරන ලද) පෙරපාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

7.2.2.3 පළපුරුද්ද :- අදාළ නැත.

7.2.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ගුරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය :- 2021/01/27
යොමු අංකය :- B-5/A9/2/2/257

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :- අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

සටහන :- ලකුණු ලබාගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

(පෙරපාසල් ගුරු තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය - ඇමුණුම 02.)

7.2.4.1.1 පවත්වන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :-
මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ... පවත්වනු ලැබේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ ... බලධරයා.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල දැන්වීම් පළ කිරීම හෝ ... දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. ... අමතරව වෙබ් අඩවියේද දැන්වීම් පල කල හැකිය.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

ගුරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :

7.3.2 සුදුසුකම්

7.3.3.1 අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී භාෂාවට සහ ගණිතයට සම්මාන ... සහිත ව විෂයයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (... විෂයයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

7.3.3.2 වෘත්තීය සුදුසුකම් :- පෙරපාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙරපාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ... සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය.

7.3.3.3 පළපුරුද්ද :- අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන ,සේවය ස්ථිර කර ඇති හා වසර 05ක ... හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

7.3.3.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.3.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

iii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

iv. අයදුම්පත් කැඳවන දිනට සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන් ම සපුරා තිබිය යුතුය.

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව :- }

7.3.3.2 උපරිම සීමාව :- } දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1 ලිඛිත විභාගය :-

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

7.3.4.1.1 පවත්වන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

(පෙරපාසල් ගුරු තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය (සීමිත) සඳහා වන විෂය නිර්දේශය - ඇමුණුම 02.)

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ :- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- අභ්‍යන්තර දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නැත.

## 8. කාර්යක්ෂමතා කඩඉම

8.1

| ...මන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ගත වීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 03) |
| 2වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 03ක් ගත වීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 04) |
| 3වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී අවු.05ක් ගතවීමට පෙර තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය. | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 05) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? :-

වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? :-

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම } අදාළ පත්කිරීම් බලධරයා.
3 වන කාර්යක්ෂමතා කඩඉම

## 9 භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුන නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 හා ඊට ආනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂාව ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාළ නැත. |

## 10 ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රිය සේවා කාල සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර ද (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාල සම්පූර්ණ කර තිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත අ පත්‍රය( ඇමුණුම 06) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් ක ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, සේවයේ ව දහය(10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් ප එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා වි සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

218

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. සේවා ශ්‍රේණියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා, පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 06) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සේවයේ වසර දහය (10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**11 තනතුරුවලට පත් කිරීම** :- අදාළ නැත.

11.1 **සුදුසුකම්**

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| | | |

**12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය : 2021/06/25
ගොනු අංකය : 603/A7/12/7/25

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :-**

<u>III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම</u> :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනට පෙරපාසල් ගුරු තනතුරේ III ශ්‍රේණිය සේවය කරන නිලධාරීන් මෙම පරිපාටියට අනුව පෙරපාසල් ගුරු තනතුරේ III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනට පෙරපාසල් ගුරු තනතුරේ II ශ්‍රේණිය සේවය කර නිලධාරීන් මෙම පරිපාටියට අනුව පෙරපාසල් ගුරු තනතුරේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක දිනට පෙරපාසල් ගුරු තනතුරේ I ශ්‍රේණිය සේවය කර නිලධාරීන් මෙම පරිපාටියට අනුව පෙරපාසල් ගුරු තනතුරේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සටහන :-
අන්තර්ග්‍රහණයෙන් අනතුරුව කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි කටයුතු කළ යුතු

- මෙම පරිපාටියට අනුව III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් අතුරෙන් අන්තර්ග්‍රහණයට පෙ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් ව ඇති නිලධාරීන් අන්තර්ග්‍රහණයට පසු III ශ්‍රේණි කාර්යක්ෂමතා කඩඉම සමත් වූවා සේ සලකනු ලැබේ.

- අන්තර්ග්‍රහණයට පෙර පෙරපාසල් ගුරු II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නිලධාරී අන්තර්ග්‍රහණයෙන් පසුව III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

- II ශ්‍රේණිය අන්තර්ග්‍රහණය කරනු ලැබූ සියලු නිලධාරීන් අන්තර්ග්‍රහණයෙන් පසු II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය

- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ සියලු නිලධාරීන් අන්තර්ග්‍රහණයෙන් අනතුරුව I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

- අන්තර්ග්‍රහණය කරන දිනට අන්තර්ග්‍රහණය කරන තනතුරට පත්වීමට අවශ්‍ය සේවා කාලයට වඩා වැඩිපුර සේවය කර ඇති සේවා කාලය ඊළඟ ඉහළ තනතුරට උසස් කිරීමේදී අවශ්‍ය සේවා කාලය සඳහා සලකා බලනු ලැබේ.

- අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ වැටුප ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව තීරණය කරනු ලැබේ. වැටුප් වර්ධක දිනයේ වෙනසක් ඇති නොවේ. මෙහිදී ලබමින් සිටි වැටුප තව වැටුප් පරිමාණයේ වැටුප් පියවරට සමාන වන අවස්ථාවකදී වැටුප් පියවරෙහි වෙනසක් ඇති නොවේ.

**15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා ඇති කරුණු සම්බන්ධව ගැටළු පැන නගින අවස්ථාවකදී හා/හෝ මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගුරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ඇත.**

**16. අර්ථ නිරූපණ**

සතුටුදායක සේවා කාලය:-

(i) පළාත් සහා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්කිරීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) නිලධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03 ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ ii වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේ දී බැහැර කළ යුතු වන්නේය.

සක්‍රීය සේවා කාලය:-

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

නියමිත දිනට:-

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධරයින්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධරයින්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

| | | | |
|---|---|---|---|
| සකස් කලේ | : [signature] | පරීක්ෂා කලේ | : [signature] |
| නම | ජී. කේ. ජී. එම්. මෛත්‍රීරත්න | නම | පී. කේ. සී. කුලරත්න |
| තනතුර | පරිපාලන නිලධාරී, පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.), කොළඹ 07. | තනතුර | නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස් (රා.ඉ.), පළාත් පාලන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත |
| දිනය | 17.08.04 | දිනය | 2017-8-4 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : [signature]
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :
තනතුර : චන්ද්‍රානි සමරකෝන්, පළාත් පාලන කොමසාරිස්, බස්නාහිර පළාත
දිනය : 2017.08.8

ගුරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. 2017/08/25
අනුමත අංකය : B-05/AP/01/17/257

යොමු අංකය : CM/WP/E15/6/1-2

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි පෙරපාසල් ගුරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : [signature]
අමාත්‍යාංශ ලේකම්(බ.ප)

දිනය : 8/11

නිල මුද්‍රාව: චන්ද්‍රානි සමරකෝන්, ලේකම් (වැ.බ.), පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, ... අමාත්‍යාංශය, (බස්නාහිර පළාත)

යොමු අංකය : CSO/PTR/15/3/6

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි පෙරපාසල් ගුරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

ප්‍රධාන ලේකම්(බ.ප)

දිනය : 2017/08/22

නිල මුද්‍රාව: එම්.ජී.බී. දයා සේනාරත් ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

---

යොමු අංකය : WPC/PSC/ADM/16/4/57

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි පෙරපාසල් ගුරු තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..............................

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

දිනය : 2017-10-06

නිල මුද්‍රාව: එම්. ජී. ඒ. තිලකරත්න ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව බස්නාහිර පළාත

---

යොමු අංකය : G-5/ADM/4/7/257

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි පෙරපාසල් ගුරු තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ උසස් කිරීමේ පරිපාටිය 2017/10/25 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

ආණ්ඩුකාර ලේකම් (බ.ප)

දිනය : 2017/10/25

නිල මුද්‍රාව: පී. සෝමසිරි ආණ්ඩුකාර ලේකම් (බ.ප.)

---

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

යොමු අංකය : G-5/ADM/4/7/257 දිනය : 2017/10/25

217

226

ඇමුණුම 01

## බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුර අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව

| අනු අංකය | පළාත් පාලන ආයතනය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | කොළඹ මහා නගර සභාව | 43 |
| 2. | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | 12 |
| 3. | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | 01 |
| 4. | මොරටුව මහ නගර සභාව | 22 |
| 5. | කඩුවෙල මහ නගර සභාව | 03 |
| 6. | මීගමුව මහ නගර සභාව | 12 |
| 7. | ගම්පහ මහ නගර සභාව | 02 |
| 8. | කොලොන්නාව නගර සභාව | - |
| 9. | සීතාවකපුර නගර සභාව | 02 |
| 10. | මහරගම නගර සභාව | 07 |
| 11. | කැස්බෑව නගර සභාව | - |
| 12. | බොරලැස්ගමුව නගර සභාව | - |
| 13. | වත්තල මාබෝල නගර සභාව | 02 |
| 14. | කටුනායක සීදූව නගර සභාව | 06 |
| 15. | මිනුවන්ගොඩ නගර සභාව | - |
| 16. | ජා ඇල නගර සභාව | 01 |
| 17. | පෑලියගොඩ නගර සභාව | 02 |
| 18. | පානදුර නගර සභාව | 04 |
| 19. | හොරණ නගර සභාව | 10 |
| 20. | කළුතර නගර සභාව | 01 |
| 21. | බේරුවල නගර සභාව | - |
| 22. | කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | 02 |
| 23. | සීතාවක ප්‍රාදේශීය සභාව | 06 |
| 24. | හෝමාගම ප්‍රාදේශීය සභාව | 02 |
| 25. | වත්තල ප්‍රාදේශීය සභාව | 02 |
| 26. | කටාන ප්‍රාදේශීය සභාව | 02 |
| 27. | දිවුලපිටිය ප්‍රාදේශීය සභාව | - |
| 28. | මීරිගම ප්‍රාදේශීය සභාව | 04 |
| 29. | මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව | - |
| 30. | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | 05 |
| 31. | ගම්පහ ප්‍රාදේශීය සභාව | 01 |
| 32. | ජා ඇල ප්‍රාදේශීය සභාව | - |
| 33. | මහර ප්‍රාදේශීය සභාව | 02 |
| 34. | දොම්පෙ ප්‍රාදේශීය සභාව | 03 |
| 35. | බියගම ප්‍රාදේශීය සභාව | 02 |
| 36. | කැලණිය ප්‍රාදේශීය සභාව | 02 |
| 37. | මදුරාවල ප්‍රාදේශීය සභාව | 03 |
| 38. | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | 06 |
| 39. | මතුගම ප්‍රාදේශීය සභාව | 05 |
| 40. | දොඩංගොඩ ප්‍රාදේශීය සභාව | 03 |
| 41. | කළුතර ප්‍රාදේශීය සභාව | 03 |
| 42. | පානදුර ප්‍රාදේශීය සභාව | 05 |
| 43. | බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව | 03 |
| 44. | හොරණ ප්‍රාදේශීය සභාව | 02 |
| 45. | බේරුවල ප්‍රාදේශීය සභාව | 05 |
| 46. | පාලින්දනුවර ප්‍රාදේශීය සභාව | 01 |
| 47. | අගලවත්ත ප්‍රාදේශීය සභාව | 01 |
| 48. | වලල්ලාවිට ප්‍රාදේශීය සභාව | 03 |
| | එකතුව | 203 |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
දිනය 2021/07/...
ලේඛන අංකය ... 14/7/257

ඇමුණුම

<u>බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර</u>
<u>තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ</u>
<u>පෙරපාසල් ගුරු තනතුරට බඳවා ගැනීම සඳහාවන ලිඛිත විභාගය (සීමිත/ විවෘත)</u>

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :-
   බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුරට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය (සීමිත/ විවෘත)

2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 % |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :-
   ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම. |
| සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන් ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ. |

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : බස්නාහිර පළාත
2017.08.8

ගරු කොමසාරිස්තුමා විසින් අනුමත කරන ලදී
2017/10/25

216
221

ඇමුණුම 03.

## බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුර සඳහා I කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :-
බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුර සඳහා I කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| පෙරපාසල් කටයුතු පිළිබඳ අවබෝධය හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය, ආයතන සංග්‍රහය, පළාත් මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම. | පැය 02 1/2 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :-වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පෙරපාසල් කටයුතු පිළිබඳ අවබෝධය හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය, ආයතන සංග්‍රහය, පළාත් මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම. | පෙර පාසලක තිබිය යුතු මූලික අවශ්‍යතා හඳුනා ගැනීම හා ළදරු මනස තේරුම් ගැනීමට ඇති හැකියාව මැන බැලීම, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහය II, IV පරිච්ඡේද හා ආයතන සංග්‍රහයේ VII, VIII, XII ,XXIV පරිච්ඡේද පිළිබඳ මූලික දැනුම ,පළාත් මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම මැන බැලීම. |

අත්සන : ..........(signature)..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : චන්ද්‍රානි සමරකෝන්
තනතුර : පළාත් පාලන කොමසාරිස්
දිනය : ......බස්නාහිර පළාත......

2017.08.8

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :.....ගසේ/සං/6/7/257..... දිනය .....2017/08/25

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර**
**තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ**
**පෙරපාසල් ගුරු තනතුර සඳහා II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :-
බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුර සඳහා II කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| පූර්ව ළමා විය සංවර්ධනය පිළිබඳව ඇති අවබෝධය හා පෙරපාසල් පරිපාලනය පිළිබඳ දැනුම මැන බැලීම. | පැය 02 | 100 | 40 % |

3.පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

4.පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5.විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පූර්ව ළමා විය සංවර්ධනය පිළිබඳව ඇති අවබෝධය හා පෙරපාසල් පරිපාලනය පිළිබඳ දැනුම මැන බැලීම. | පෙර පාසලක තිබිය යුතු මූලික හා අවම අවශ්‍යතා හඳුනා ගැනීම, පූර්ව ළමා විය සංවර්ධන අවධියේ දරුවන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීම, පෙර පාසලක පවත්වාගෙන යා යුතු පොත් පත් හා ලේඛන පිළිබඳව ඇති දැනුම මැන බැලීම, දරුවන්ගේ සිත් ගන්නා අයුරින් පෙර පාසලක් පවත්වාගෙන යාම හා එහි පිරි සැකැස්ම, පෙර පාසලක් ලියා පදිංචි කිරීම හා මනාව පවත්වාගෙන යාම පිළිබඳව ඇති දැනුම මැන බැලීම. |

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..... චන්ද්‍රානි සමරකෝන්
තනතුර : ... පළාත් පාලන කොමසාරිස්
දිනය : ......... බස්නාහිර පළාත
2017.08.8

ගුරු ආත්ලුකාරතුමා විසින් අනුමත කරන ලදී. දිනය ........ 2017/10/25
ගොනු අංකය ........ 609/1497/4/7/457

ඇමුණුම 05

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුර සඳහා III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :-
   බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා
   ගණයේ පෙරපාසල් ගුරු තනතුර සඳහා III කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත)

2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | අවම සමත් ලකුණු |
|---|---|---|---|
| පෙරපාසල් ගුරුවරයා සතු වගකීම හා පෙරපාසල් කළමනාකරණය පිළිබඳ දැනුම මැන බැලීම හා ආයතන සංග්‍රහය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග :-වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| පෙරපාසල් ගුරුවරයා සතු වගකීම හා පෙරපාසල් කළමනාකරණය පිළිබඳ දැනුම මැන බැලීම හා ආයතන සංග්‍රහය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. | පෙරපාසල් ගුරු භූමිකාව, පෙරපාසල් පරිපාලනය, පූර්ව ළමාවිය සම්බන්ධ දාර්ශනික මත, මූලධර්ම, පර්යේෂණ, අදහස් පිළිබඳව ඇති දැනුම, විශේෂිත අධ්‍යාපන අවබෝධයන් ඇති දරුවන් හඳුනා ගැනීම හා ඔවුනට අධ්‍යාපනය ලබා දෙන ක්‍රමවේදයන් හඳුනා ගැනීම, විධිමත් පාසලට දරුවා හුරු කිරීම, ආයතන සංග්‍රහයට අනුව පත්කිරීම් ලිපිය, හිමි නිවාඩු, දෛනික සේවා කාලය පිළිබඳ ඇති දැනුම පරීක්ෂා කිරීම. |

අත්සන : ..................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..................................
තනතුර : ..................................
දිනය : ..................................

චන්ද්‍රානි සමරකෝන්
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත

2017 . 08 . 8

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
දිනය :.........10/10/18
ගොනු අංකය :.........
603/ADM/4/7/257

# බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ පෙරපාසල් ගුරු තනතුර ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

1. නිලධාරියා පිළිබඳ තොරතුරු
   - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................
   - 1.2 හැඳුනුම්පත් අංකය : ..........................................................................
   - 1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................
   - 1.4 අයත්වන සේවය හා තනතුර : ..........................................................................
   - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..........................................................................

2 පත්වීම පිළිබඳ තොරතුරු
   - 2.1 පත්කිරීම් දිනය : ..........................................................................
   - 2.2 පත්කිරීම් ස්ථිර කළ දිනය : ..........................................................................
   - 2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය:

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

   - 2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය:

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3 උසස් වීමට අදාළ තොරතුරු
   - 3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1
   - 3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය
     - 3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත.
     - 3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..........................................................................
     - 3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම්කර තිබේ ද? ඔව්/නැත.
     - 3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේ ද? ඔව්/නැත.
       උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත.
     - 3.2.5 විනය දඬුවම් ලබා තිබේ ද? ඔව්/නැත.

4 අයදුම්කරුගේ ප්‍රකාශය.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ........................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ 11/1 ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

..........................................

දිනය: නිලධරයාගේ අත්සන.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලේඛ අංකය :.................... දිනය :....................

5 **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ අංශ ප්‍රධානියාගේ නිර්දේශය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, ඉහත නම් සඳහන් ..................................................... මහතා/මහත්මිය/මෙනෙවිය ......................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම සේවකයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

| | |
|---|---|
| නම | : ........................................... |
| අත්සන | : ........................................... |
| දිනය | : ........................................... |
| නිල මුද්‍රාව | : ........................................... |

6 **නාගරික කොමසාරිස්ගේ/ ලේකම්ගේ අනුමැතිය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බැවින්, ඉහත නම් සඳහන් ..................................................... මහතා/මහත්මිය/මෙනෙවිය ......................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වෙමි. ඒ අනුව ...................................................................... මහත්මා/ මහත්මිය/ මෙනවිය ...................... දින සිට ................ ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි.

| | |
|---|---|
| නම | : ........................................... |
| අත්සන | : ........................................... |
| දිනය | : ........................................... |
| නිල මුද්‍රාව | : ........................................... |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද
ගොනු අංකය :.................. දිනය : 2017/10/25